නිකුත් කිරීම: 2024 පෙබරවාරි

අනුක්‍රමික අංක: 03/24

තේ ඉඩම්වල වල් පැළෑටි රසායනිකව පාලනය කිරීම

(මෙම චක්‍රලේඛය මගින් 2023 මැයි මස නිකුත් කරන ලද අනුක්‍රමික අංක 03/23, PU3 උපදෙස් චක්‍රලේඛය සහ එයට අදාල පෙර චක්‍රලේඛ ප්‍රතිස්ථාපනය වන අතර 2024 පෙබරවාරි මස නිකුත් කරන ලද අනුක්‍රමික අංක 24/24, චක්‍රලේඛ අංක WM 1 සමඟ සම්බන්ධ වේ)

තේ පර්යේෂණ ආයතනයේ උපදෙස් චක්‍රලේඛ WM 1 හි දක්වා ඇති පරිදි ඒකාබද්ධ වල්පැළෑටි කළමනාකරණ (IWM) ප්‍රවේශයට, අතින්, යාන්ත්‍රිකව, ශෂ්‍ය ක්‍රම හා රසායනික ක්‍රම (ක්‍රම මාරුවෙන් මාරුවට වෙනස් කරමින් කරන පදනම මත) ඇතුළත් වේ. වල්නාශක භාවිතයේදී වල්පැළ තෝරා විනාශ කිරීමේ හැකියාව සහ යොදන පිරිවැයට ඇති ඵලදායීතාවය වැනි වාසි ඇති නමුත් සමහර විට, බෝගයට හානිවීම්, වල් නාශක අවශේෂ පැවතීම සහ පාරිසරික ගැටළු ආදි අවාසිද ඇති වේ. මෙම අවාසි මඟ හරවා ගැනීම සඳහා වල් නාශක යොදන අවස්ථා ගණන වසරකට වාර දෙකකට සීමා කිරීම සහ නිර්දේශිත අනුපාතයන්ට අනුගත වීම ආදිය කල යුතු වේ.

වල් නාශක භාවිතා කරන විට, අවම වශයෙන් සතියක් වන පෙර අස්වනු විරාම කාලය (PHI) සමඟ තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශයන් සෑම විටම අනුගමනය කළ යුතුය. වල් නාශක සුළඟට ගසාගෙන විත් තේ දළු සහ කොළ පැහැනි කඳන් මතට පතිත වීම වළක්වා ගැනීමට ද පූර්වාරක්ෂිත ක්‍රියාමාර්ග ගත යුතුය.

1. බහුලව ඇති වල් පැළෑටි

මීටර් 0.5 - 1 ක විසිරුම් පළලකින් යුත් නැසින්නයක් සවි කර ඇති නැප්සැක් ඉසිනයක් භාවිතා කරන විට බාර් 1 - 2 ක පීඩනයක් යොදමින් පොලොවේ සිට සෙ.මී.35 – 50 පමණ උසකින් ඉසින විට, ක්ෂේත්‍රයේ හෙක්ටයාරයක් ආවරණය කිරීම සඳහා වල් නාශක ද්‍රාවණය ලීටර් 450 - 500 ප්‍රමාණයක් අවශ්‍ය වේ.

1.1 දලු නොකඩන තේ ක්ෂේත්‍ර (නව වගාවන්/ කප්පාදුවේ සිට මට්ටම් කැපීම තෙක්)

සක්‍රීය ද්‍රව්‍යය (a.i.)	වෙළඳ නාමය	ROP ලියාපදිංචි අංකය	මාත්‍රාව/ හෙක්ටයාරයකට	වෙනත් කරුණු
ඔක්සිෆ්ලෝර්ෆෙන් (24%) (Oxyfluorfen)	ගෝල් (Goal) 2E	H260000	ලීටර් 1.2ක් ජලය ලීටර් 500 ක (මිලි ලීටර් 10ක් ජලය ලීටර් 4.5ක)	<u>තෙතමනය සහිත පසු</u> මතට යොදන්න
ඔක්සිෆ්ලෝර්ෆෙන් (48%) (Oxyfluorfen)	ගෝල් (Goal) 4F	M550000	මිලි ලීටර් 700 ක් ජලය ලීටර් 500 ක (මිලි ලීටර් 6ක් ජලය ලීටර් 4.5ක)	

1.2 දලු නෙලන තේ ක්ෂේත්‍ර (පරිණත ක්ෂේත්‍ර / පළමු කප්පාදු කිරීමෙන් පසු)

සක්‍රිය ද්‍රව්‍යය (a.i.)	වෙළඳ නාමය	ROP ලියාපදිංචි අංකය	මාත්‍රාව/ හෙක්ටයාරයකට	වෙනත් කරුණු
ඩයුරොන් (Diuron) (80% WP)	හේලීස් ඩයුරොන්	K570700	කිලෝග්‍රෑම් 1.2 ජලය ලීටර් 500 ක (ග්‍රෑම් 10.8 ක් ජලය ලීටර් 4.5 ක)	තෙතමනය සහිත පසකට පමණක් යොදන්න (පූර්ව නිර්ගමන වල් නාශකයක් ලෙස)
	ඩ්‍රක්‍රොන් ඩයුරොන්	K570500		
	ඔඑසිස් ඩයුරොන්	K570100		
	විරොන් ඩයුරොන්	K570000		
	සී අයි සී ඩයුරොන්	K570300		
	ඇග්ස්ටා ඩයුරොන්	K570200		
	ප්ලාන්ටකෙම් ඩයුරොන්	K570400		
ඩයුරොන් දියර 50% SC	ලික්විඩෝ ඩයුරොන්	M590000	ලීටර් 1.5 ක් ජලය ලීටර් 500 ක (මිලි ලීටර් 13.5 ක් ජලය ලීටර් 4.5 ක)	තෙතමනය සහිත පසකට යොදන්න (පූර්ව නිර්ගමන හා පශ්චාත් නිර්ගමන වල් නාශකයක් ලෙස)
ඔක්සිෆ්ලෝර්ෆෙන් (24%) (Oxyfluorfen)	ගෝල් (Goal) 2E	H260000	ලීටර් 1.2ක් ජලය ලීටර් 500 ක (මිලි ලීටර් 10.8 ක් ජලය ලීටර් 4.5ක)	තෙතමනය සහිත පසකට යොදන්න
ඔක්සිෆ්ලෝර්ෆෙන් (48%) (Oxyfluorfen)	ගෝල් (Goal) 4F	M550000	මිලි ලීටර් 700 ක් ජලය ලීටර් 500ක (මිලි ලීටර් 6.3 ක් ජලය ලීටර් 4.5ක)	
ග්ලයිෆොසේට් (Glyphosate) 36% w/v	සිපෙට්කෝ ග්ලයිෆොසේට්	N 530200 N 540200	ලීටර් 2 .5 ක් ජලය ලීටර් 500 ක (මිලි ලීටර් 22.5 ක් ජලය ලීටර් 4.5 ක)	නව වගාවන්ට හා කප්පාදු ඉඩම් වලට ඉසීමෙන් වළකින්න.
	ග්ලයිටෝල් ග්ලයිෆොසේට්	N530300 N541000		
	ෆාස්ට් ග්ලයිෆොසේට්	N530400 N541100		
	කවුන්ට් අප් ග්ලයිෆොසේට්	N530500 N541500		
	ICS ග්ලයිෆොසේට්	N530600 N540500		
	CIC ග්ලයිෆොසේට්	N540300		
	සන්පවර් ග්ලයිෆොසේට්	N540400		
	බ්‍රවුන්ස් ග්ලයිෆොසේට්	N540600		
	D-ඩෑෂ්ග්ලයිෆොසේට්	N540700		
	කවුන්ට්ලන් ග්ලයිෆොසේට්	N540800		
	පියෝ ග්ලයිෆොසේට්	N540900		
	කොමියන් ග්ලයිෆොසේට්	N541200		
	හේලීස් ග්ලයිෆොසේට්	N541300		

	රොබින් ග්ලයිෆොසේට්	N541400		
	G2 ග්ලයිෆොසේට්	N541600		
	ජීව්රෝ ග්ලයිෆොසේට්	N541700		
	අප් රෑට් ග්ලයිෆොසේට්	N541800		
	මේජර් ග්ලයිෆොසේට්	N541900		
	බවර්සේෆ් ග්ලයිෆොසේට්	N542000		
ග්ලූෆොසිනේට් ඇමෝනියම් (Glufosinate ammonium)	ලයිෆ්ලයින් ග්ලූෆොසිනේට් ඇමෝනියම් (28% 280 g/L SL)	M890100	මිලි ලීටර් 700 ක් ජලය ලීටර් 500ක (මිලි ලීටර් 6.3 ක් ජලය ලීටර් 4.5ක)	පශ්චාත් නිර්ගමන සහ තෝරා නොනසන වල් නාශකයක් ලෙස යොදන්න
	සැග්ලා ග්ලූෆොසිනේට් ඇමෝනියම් (15% 150 g/L SL)	N910000	ලීටර් 1.4ක් ජලය ලීටර් 500ක (මිලි ලීටර් 12.5 ක් ජලය ලීටර් 4.5ක)	
MCPA 60%	හේඩොල් MCPA60% භාක්‍රොස් MCPA60%	0070000 0070001	ලීටර් 2ක් ජලය ලීටර් 500ක (මිලි ලීටර් 18 ක් ජලය ලීටර් 4.5ක)	ගිරාපලා (අමලේ), ගැටකොල (*Borreria*), වතුපාලු (*Mikania*), පොලිගොනම් විශේෂ සහ මෝර්නින්ග් ග්ලෝරි වැනි පළල් පත්‍ර වල් පැළෑටි පාලනය සඳහා එම ස්ථානයන්ට පමණක් වන සේ ඉසින්න.තේ පඳුරේ පත්‍ර මතට ඉසීමෙන් දැඩි ලෙස වළකින්න.
ග්ලයිෆොසේට් අයිසො ප්‍රොපිල් ඇමීන් 29.3% + MCPA අයිසො ප්‍රොපිල් ඇමීන් 5.8%	රැපිඩ්	Q380000	ලීටර් 2.5ක් ජලය ලීටර් 500ක (මිලි ලීටර් 22.5 ක් ජලය ලීටර් 4.5ක)	නව වගාවන්ට හා කප්පාදු ඉඩම් වලට ඉසීමෙන් වළකින්න.

2. මර්ධනය කිරීමට අපහසු වල් පැළ

තේ ඉඩම්වල ඇති මර්ධනය කිරීමට අපහසු වල් පැළෑටි පාලනය කිරීම සඳහා පහත සඳහන් කොක්ටේල් මිශ්‍රණ එම වල් පැළඇති ස්ථානයන්ට පමණක් යෙදීම නිර්දේශ කෙරේ.

වල් පැළෑටි වර්ගය	වර්ග මීටර් 200 කට මාත්‍රාව
ගැටකොල (*Spermacoce ocymifolia*)	ඩයුරොන්(80%) ග්‍රෑම් 24 ක් + ග්ලයිෆොසේට් මිලි ලීටර් 28 ක් ජලය ලීටර් 10 ක දියකර
වල් බෝවිටියා (*Miconia crenata*)	
හීන් ඇටවරා/ African Couch grass (*Digitaria abyssinica*)	ග්ලයිෆොසේට් මිලි ලීටර් 200 ක් ජලය ලීටර් 10 ක දියකර
ඇටවරා/ Couch Grass (*Panicum repens*)	ග්ලයිෆොසේට් මිලි ලීටර් 100 + කෙඕලින් ග්‍රෑම් 60 ක් ජලය ලීටර් 10 ක දියකර
ඉලුක් (*Imperata cylindrica*)	ග්ලයිෆොසේට් මිලි ලීටර් 100 ක් ජලය ලීටර් 10 දියකර
	ග්ලයිෆොසේට් මිලි ලීටර් 50 + කෙඕලින් ග්‍රෑම් 60 ක් ජලය ලීටර් 10 ක දියකර

3. වල් නාශක ආරක්ෂිතව හා ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා මාර්ගෝපදේශ

අ) හිතකර වල් පැළෑටි ඉතිරිකර තබා ගැනීමට සහ ප්‍රතිරෝධී වල් පැළෑටි පාලනය කිරීම සඳහා ස්ථාන අනුව තෝරා සකස් කරගත් ඉසින වැඩසටහනක් අනුගමනය කරන්න. එවැනි ප්‍රතිරෝධී වල් පැළෑටි සඳහා විශේෂිත වල් නාශකයන්හි නිර්දේශිත මාත්‍රා යෙදිය යුතුය. විකල්පයන් ලෙස, වෙනත් වඩාත් ඵලදායී පාලන ක්‍රමද අනුගමනය කළ හැක.

ආ) ක්ෂේත්‍රයේ ඇති වල් පැළෑටි වර්ග හා වර්ධන අවධිය මත පදනම්ව වඩාත් සුදුසු වල් නාශකයක් තෝරා ගන්න. වල් නාශකයේ නිර්දේශිත මාත්‍රාව පිරිසිදු ජලයේ හොඳින් මිශ්‍ර කර ඉසිය යුතු ප්‍රදේශය ආවරණය කිරීමට අවශ්‍ය ඉසින පරිමාව සාදාගන්න. වෙනත් ද්‍රව්‍ය මිශ්‍රවීම වළක්වා ගැනීම සඳහා භාවිතයට පෙර ඉසින ටැංකි පිරිසිදු ජලයෙන් හොඳින් සෝදා ගන්න.

ඇ) වර්ෂයක් සඳහා වල් නාශක යෙදුම් අවම වාර ගණනක (එක් වල් නාශකයකින් උපරිම වාර දෙකක්) පවත්වාගෙන යාම සහ තනි වල් නාශකයක් දිගටම භාවිතා නොකර වරින් වර වෙනස් වෙනස් ක්‍රියාකාරිත්වයන්ගෙන් යුත් වල් නාශක කිහිපයක් භාවිතා කිරීම, වඩා යෝග්‍යය. ප්‍රතිරෝධී වල් පැළ ඇතිවීම වැළැක්වීමට මෙය බෙහෙවින් උපකාරී වේ.

ඈ) තේ පඳුර මත වැඩෙන වැල් වර්ග මතට වල් නාශක ඉසීමෙන් වලකින්න. ඒවා පහළට ඇද පේළි අතර අවකාශයේ තබා වල්නාශක ඉසින්න. මේරූ කාශ්‍යීය ශාක හා ගැඹුරට මුල් බැස ඇති වල් පැළ විශේෂ කපා දමා නැවත මතුවන ළපටි කොටස් මතට වල් නාශක ඉසිය යුතුය.

ඉ) වල් පැළවල මල් පිපීමට / බීජ හටගැනීමට පෙර, සාපේක්ෂව ළපටි අවධියේ දී වල් නාශක ඉසින්න.

ඊ) සුළඟ මගින් ඉසින ද්‍රාවණය අපේක්ෂිත ඉසින ප්‍රදේශයෙන් ඉවතට ගෙන යා හැකි බැවින් ඉසීම සඳහා සුළඟ නොමැති දිනයක් තෝරාගන්න. දවසේ ඉතා උණුසුම් කාල පරිච්ඡේදයන්හි දී ද වල් නාශක ඉසීමෙන් වැලකී සිටින්න.

උ) තේ පේළි අතර වල් නාශක ඉසීමේදී ඉසිනයට ආරක්ෂක ආවරණයක් (spray guard) භාවිතා කරන්න. මෙමඟින් පර්යන්ත තේ අතු සහ කොළපැහැනි කඳන් මත අධික ලෙස වල් නාශක පතිතවීම වළක්වා ගත හැකි වනු ඇත.

ඌ) වල් නාශක ආරක්ෂිතව හා ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා වඩා යෝග්‍ය ලීවරයෙන් ක්‍රියාකරන, ප්‍රාචීරය වර්ගයේ නැප්සැක් ඉසින භාවිතා කරන්න. සියලුම ඉසිනවල ක්‍රියාකාරීත්වය පරීක්ෂා කළ යුතු අතර, ප්‍රේරක කපාට සහ නැසින කාන්දු වීම් සඳහා පරීක්ෂා කළ යුතුය.

එ) නිවැරදි වර්ගයේ පොලි ජෙට් /ෆ්ලඩ් ජෙට් නැසිනි භාවිතා කරන්න (කඟ: විසිරුම් පළල මීටර් 0.5ක් හා, ඉසින ප්‍රතිදානය විනාඩියකට ලීටර් 0.6 වන, හෝ කොළ: විසිරුම් පළල මීටර් 1.0ත් හා ඉසින ප්‍රතිදානය විනාඩියකට ලීටර් 1.2 වන).

ඒ) වල් නාශක මිශ්‍ර කරන විට සහ ඉසින විට ආරක්ෂිත ඇඳුම් අඳින්න.

ඔ) භාවිතා කිරීමෙන් පසු ටැංකිය, නැසින ආදිය හොඳින් පිරිසිදු කර, තමා සහ ආරක්ෂිත ඇඳුම් ද හොඳින් සෝදන්න. හිස් වල්නාශක බහාලුම් විශේෂයෙන් ඇළ දොළ සහ ජල මාර්ග වලට විසි කිරීමෙන් වැළකී සිටින්න.

ඕ) ආරක්ෂිත හා ඵලදායී වල් පැළැටි පාලනයක් සහතික කිරීම සඳහා සමස්ත මෙහෙයුම ප්‍රවේශමෙන් අධීක්ෂණය කිරීම අත්‍යවශ්‍ය වේ.

ක) වැරදි ලෙස හැසිරවීම වැළැක්වීම සඳහා කෘෂි රසායන වෙන වෙනම ගබඩා කරන්න.

ග) වල් නාශක මිලදී ගැනීම්, ගබඩා කිරීම, නිකුත් කිරීම් සහ භාවිතය පිළිබඳ නිසි වාර්තා පවත්වා ගෙන යන්න.

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
තලවකැලේ

ප්‍රකාශන හිමිකම

සියලුම හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ ලිඛිත අවසරයකින් තොරව මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් ඡායා පිටපත් කිරීම, පටිගත කිරීම, ස්කෑන් කිරීම හෝ තොරතුරු ගබඩා කිරීම සහ ආපසු ලබා ගැනීම ඇතුළත්ව විද්‍යුත් හෝ යාන්ත්‍රික හෝ කිසිදු ආකාරයකින් නැවත පළ කිරීම හෝ සම්ප්‍රේෂණය කළ නොහැක.